
ඈ මග
කතා
ඔමන්දී මිනෝදා දිසානායක

# ආ මග තතු

එම්.ඩී.එම්. ඔමන්දි මිනෝදා දිසානායක

# ආ මග තතු


එම්.ඩී.එම්. ඔමන්දී මිනෝදා දිසානායක

**කතෘ**


**කතෘගේ වෙනත් කෘති**

විස්මිත කන්ණාඩිය


මහ/මහාමායා බාලිකා විද්‍යාලය

8 ශ්‍රේණිය



2025.02.08

**ISBN – IS**37815

# පිදුම

උපන්දා සිට

මා ඇති දැඩිකොට

ආරක්ෂා කළ.......

මිහිපිට දෙවියන් වන්

මාගේ දෙමාපියන්ටත්........

සිප් කිරි සයුරේ කිමිදෙන්නට මෙන්ම

ග්‍රන්ථකරණයට මා යොමු කළ

දෙවැනි මව්පියන් වූ

ගුරු දෙවිවරුන්ටත්........

පුදමි මාගේ පන්හිදෙන් ලියවුණු

අමුතු සටහන.

මේ මාගේ

දෙවන ග්‍රන්ථයයි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මම දිලුනි. මම ඉගෙන ගන්නේ පහ වසරේ. පහ වසරේ කිව්වට, ශිෂ්‍යත්වය නම් ලියලා ඉවරයි. ආ...! ශිෂ්‍යත්වය කියද්දියි මට මතක් වුණේ. අද මට හරිම සතුටු දවසක්. අද මහා පුදුම දෙයක් තමයි මට වුණේ. මම සුපුරුදු විදියටම ඉස්කෝලේ ගියා. ගිහිල්ලා පන්තියෙත් වාඩි වුණා. ඒ උනාට මට හරි අමුත්තක් දැනුණා. ඒ මොකද කිව්වොත්, හැමෝම වෙනදට වඩා මගෙ දිහා මහ අමුතු විදියකට බලලා හොඳින් හිනා වුණා. ඔන්න ඔය ගැන හිත හිත ඉන්නකොට තමයි යාළුවෙක් ඇවිත් කීවේ, "දිලුනි ඔයාට ප්‍රින්සිපල් සර් එන්න කිවා..." කියලා. ඒ වෙලාවේ මට හිතුණා මම මොනවා හරි වැරැද්දක් කරලා ද කියලා.

ඉතින් බයෙන් බයෙන් තමා ප්‍රින්සිපල් ඔෆිස් එකට ගියේ. ඒ උනාට ප්‍රින්සිපල් සර් හරි ලස්සනට හිනා වෙලා මට ඇතුළට එන්න කීවා. මට සුබ පැතුවා. මම බැලුවා ඇයි මේ කවදාවත් නැතුව සර් සතුටින් කියලා. ටික වෙලාවක් ගියාම තමයි දන්නේ මම ශිෂ්‍යත්වයට ලකුණු එකසිය අසූ නවයක් අරන් දිස්ත්‍රික්කයේ දෙවනියා වෙලා කියලා. ඒ වෙලාවේ මගෙ දෑසින් නැගුණු කඳුළු කැටි කම්මුල් දිගේ ගඟක් වගේ ගලාගෙන යනවා දැනුණා. ගුරු මව්වරුන් වගේම මගේ ගුරු පියවරුන් හයියෙන් අත්පොලසන් දුන්නා. උදෑසන විශේෂ රැස්වීමක් කැඳවල. අනේ.... මගේ අම්මයි අප්පච්චියි දෙන්නත් ඇවිත් හිටියා. මට දැනුණේ පුදුම සතුටක්. රැස්වීමෙදී හැමෝම මාව ඇගයුවා. මගෙන් පාඩම් වැඩ කළ ආකාරය මගේ අදහස් ප්‍රකාශ කරන්න මට අවස්ථාවක් දුන්නා. මම මට ශක්තියක් වූ මගේ ගුරු දෙගුරුන් වගේම තිලුණි අක්කා ගැනත් කීවා.

මම උපන්නේ දුෂ්කර ගමක. ඒත් ඒක හරි සුන්දර ගමක්. ගම මැදින් ගලනවා ලස්සන ඔයක්. ඒක 'ඇල්ලන ඔය' කියලා තමයි අපේ අම්මා මට කිවුවේ. ඒ ගමේ ලස්සන ගල්තලාවක් උඩ හරි ලස්සන විහාරයක් තියෙනවා. මගේ අම්මා කියන්නේ ඒ බෝධීන් වහන්සේ ළඟ පහනක් තියලා හිත සැහැල්ලු කරගන්න පුළුවන් කියලා. මමත් හරි ආසයි ඒ විහාරෙට යන්න. පහන් වැටක් පත්තු කරලා අපේ ජීවිතේට සැහැල්ලුවක් දෙන්න කියලා ඉල්ලන්න. ගමට තියෙන්නේ බස් දෙකයි. එකක් ජාතික ගමනා ගමන මණ්ඩලයේ එකක්. අනික පෞද්ගලික එකක්. සෙනග නැතත් මේ බස් දෙක ම නිවාඩු දවසට හැර හැමදාම වැඩ. හැබැයි නිවාඩු දවස් දෙකේ බෙදාගෙන එක බසයක් තමයි වැඩ කරන්නේ. අපේ ගෙදරට අල්ලපු වත්තේ හරිම නිරහංකාර කාටත් උදවු කරන අම්මෙකුයි තාත්තා කෙනෙකුයි එක්ක නිදහසේ ඉන්න අක්කා

කෙනෙකුගෙ ගෙදරක් තියෙනවා. එයා හැමෝම එක්කම හරි හිතවත්. දහම් පාසල් යනවා. සමගියෙන් හැමෝම එක්ක ඉන්නවා. හැකි හැම විටකම අනිත් අයට උදව් කරනවා.

"අක්කේ.... අනේ මට මේ පාඩම් වැඩ ටිකක් අහගන්න තියෙනවා. ඔයාට පුළුවන්ද, මට උදව් කරන්න "

" හරි බලමු, දන්න දෙයක් නම් කියලා දෙන්නම්. ආනේ... සිංහල රචනය. මම කියල දෙන්නම් නංගා. ඔයා මේ සැරේ ශිෂ්‍යත්ව විභාගය ලියනවනේ? ඒකනේ මේ මහන්සි වෙන්නේ. ඇත්තටම හොඳයි නංගී. ගොඩාක් ඔළුවට බරක් ගන්න එපා. සැහැල්ලුවෙන් පාඩම් කරන්න ඕනි. ඔයා හවසට එන්නකෝ අපෙ ගෙදර මම කියලා දෙන්නම්." ඔන්න ඔහොම තමයි කතාව ආරම්භ වුණේ.

දින, සති, මාස ගෙවී ගෙන ගියා. මම දවසක් හැර දවසක් වගේ ඒ අක්කගෙ වැඩ අතපසු නොවෙන්න, එයාට කරදරයක් නොවෙන්න ගෙදර යන්න උත්සාහ කළා.

" පුතේ ඔයා හැමදාම එහෙ යන්න එපා. ඒ අක්කිටත් පාඩම් වැඩ තියෙනවනේ. හැමවෙලේම කරදර කරන එක හොඳ නෑ. " අපේ අම්මා හැමදාම වගේ මට එහෙම කීවා.

" හා අම්මේ, මම කරදර කරන්නේ නෑ. අනෙක අක්කත් හරි ආසයි පාඩම් කියලා දෙන්න. ගණන් හදනවා හරි හරියට. එයා මට පොතකුත් දුන්නා. මේ "

" ආ... විභවාසතාමාන. ඉතින් පුතේ මේකට දෙන්න අද මගේ ළඟ සල්ලි නෑ නෙ" අම්මගේ ඇස් වලටත් කඳුලක් ආව මම දැක්කා.

"නෑ අම්මෙ, මේක මට අක්කි තෑග්ගක් විදියට දුන්නෙ. අක්කිගේ අම්මා ඔෆිස් ගිහින් එද්දි අරන් ඇවිත්. ඒ නැන්දයි මාමයි දෙන්නත් හරි හොඳයි අම්මේ. "

අපෙ අම්මත් ඉඳහිට ඒ නැන්දලගේ ගෙදරට යනවා. එයාලට ගෙදර ඉන්න වෙලාවක් ඇත්තෙම නෑ. ඒත් ගෙදර ඉන්න දවසටනම් කඩියො වගේ හැමෝම වැඩ. වත්ත සුද්ද කරනවා, පාර අතුගානවා, මල්වත්ත ලස්සනට හදනවා.... පුදුම වැඩ ගොඩක්.

" නෝනා... මම අර දර ටික ගෙට දාන්නද ? " දවසක් අපි එහෙ ගිය වෙලාවේ මගෙ අම්මා අහනවා මට ඇහුණා.

" අයියෝ...මේ ගෙදර කොහෙද නෝනලා? දිලුනිගේ අම්මේ, මම චේතනා ඔයාට පුළුවන් මට අක්කා කියලා කතා කරන්න, එහෙම හොඳයි නේද ?"

එයාලා ලොකු කතාවක් මගේ ඇස්වල කඳුළු ආවේ අපේ අම්මගේ ඉකි බිඳුම ඇහිලා. මම ඒ පැත්තට දුවගෙන ගියා.

" දිලුනිගේ අම්මේ මේ පොඩි දරුවෝ හරි සතුටින් එකට ඉන්නේ. හැමෝම මිනිස්සු අපි හැමෝම මේ ලෝකෙට එනවා හැමෝම දවසක යනවා. ඉන්න ටිකේ හැමෝම උදව් කරගෙන සතුටින් ඉන්න ඕනේ. හරි හරි ඔය කඳුළු පිහදාලා එන්න. අපි තේ එකක් බොමු " යි තිලුනි අක්කගේ අම්මා කීවා.


ඔය විදියට අපි දෙගොල්ලන් ම හරි ඉක්මනට එකතු වුණා. මම දවසක් හැර දවසක් නොවරදවාම අක්කගෙන් පාඩම් අහගන්න යනවා. එයා මට අඩුපාඩු බලලා හැකි විදියට උදව් කළා. මගේ ගුරුවරුන් කියලා දුන්නු හැම පාඩම් වැඩක් ම අත නොහැර හරියට ම කරපු මම අක්කගෙනුත් උදවු අරන් හරි ඉක්මනට පාඩම් වැඩ අවසන් කරලා හැමදාමත් සතුටින් දවස නිමා කළා.

" හ්ම්...හරි අද අපි බලමු රචනාවක් ලියන්නේ කොහොමද කියලා. අපි එක දිගටම ලියාගෙන යද්දි එකම කරුණ ආයෙ ආයෙ ලියවෙනවනේ. ඒ නිසා මතක තියාගන්න, රචනාවක් ලියන්න ඕන ක්‍රමයක් තියෙනවා මෙන්න මේ වගේ. "

එදා බෝල මුතු අකුරු වලින් වයිඩ් බෝඩ් එකේ ලස්සනට රචනාවක් ලියන හැටි අක්කා මට කියලා දුන්නා. එදා ඉඳන් මට හැමදාම රචනාවට ලකුණු හය නම් වරදින්නෙම නෑ.

"හොඳට කාලය භේදය තේරුම් අරන් ( අතීත / වර්තමාන / අනාගත) හරිම විදියට ලියන්න" කියලයි තිලුනි අක්කා කියලා දුන්නේ.

"අපි දැන් හිතමු 'මම පුවත්පතක් වෙමි' මාතෘකාව යටතේ රචනාවක් ලියන්න ආවයි කියලා. ඔන්න දැන් ඔයා ඉක්මනට මේ වගේ කටු සටහනක් ගහනවා. හැබැයි ලස්සන කර කර ඉන්න එපා. ඉක්මනට වැඩේ කරන්න ඕනි.නැත්නම් වෙලාව ගත වෙනවා වැඩියි. මේකත් එක තරග විභාගයක් කියන එක හැම වෙලේම හිතන්න ඕනි."




"මීට වඩා ගොඩක් කරුණු තව තියනවා. ඔයාට මතක් වෙන හොදම කරුණු ටික මෙහෙම ලියනවා. දැන් ඔයා ලියපු කැමතිම කරුණු ටික අරන් රචනාව ලියන්න ඕනි නංගි. මෙන්න මේ වගේ."

1. තීන්ත හා කඩදාසි යොදා මම මුද්‍රණ යන්ත්‍රයකින් ඉපදුණෙමි.
2. මා දෘශ්‍ය මාධ්‍යයක් වන අතර, මුළු ලෝකයේම මිනිස්සු මගෙන් ප්‍රයෝජන ගනිති.
3. ඔවුහු මගෙන් දේශීය හා විදේශීය තොරතරු ලබා ගනිති.
4. කුඩා ළමයින්ගේ දැනුම වර්ධනය සඳහා ද මා ප්‍රයෝජනවත් වේ.
5. එමෙන් ම නොයෙක් මිනිස්සු වින්දනය සඳහා මා කියවති.

අක්කා මට රචනාවක් ගොඩ නගරන ආකාරය කියල දුන්නා. වචන, අකුරු වෙන් කිරීම ගැන වගේම උක්ත ආඛ්‍යාතය ගැළපීම වගේ ගොඩක් දේ ගැන රචනාවක් ලියන විට අවධානය දෙන්න ඕනි කියලයි අක්කා මට කීවේ. ඉතින් මට හරිම සතුටුයි. ඇත්තටම විභාගයට මෙහෙම සූදානම් උනානම් එච්චර අමාරු වෙන එකක් නෑ කියල මට හිතුණා. එදා රචනා මාතෘකා ගොඩක් අරන්, කාලය අනුව රචනාව වෙනස් වෙන විදිය හරි ලස්සනට කියල දුන්න අක්කා සතියට එක් වතාවක් රචනාවක් ලිවීම අනිවාර්යය කළා. මම හරි සතුටින් වැඩ කළා.

" නංගී අපි හෙට අත්තම්මලාගේ ගෙදර යනවා. සතියක් විතර යයි ආයිත් එන්න." තිලුණි අක්කා කීවා.

" අයියෝ... " මට ඉබේටම කියවුණා. පාඩම් වැඩ ගැනම හිතලා නෙවෙයි, එයාලා නැතුව දැන් හරිම පාළුයි. ඒ නිසා.

" හරි හරි දවස් දෙක තුනක් විතරයි ඔයාට පාඩු වෙන්නේ. මම ඔයාට අද කියලා දෙන්නම් කරන්න වැඩක්. ඔයා ඔයාගේ සිංහල පොතේ හැම පාඩමකින්ම වාක්‍ය දහය බැගින් ලියන්න ඕනේ. විරාම ලකුණු වර්ග යෙදිලා තියෙන වාක්‍ය දහය ගානේ, හොඳ ද? එතකොට මේ දවස් ටික යනවා ඔයාට දැනෙන්නේ නෑ. විභාගෙට ඔයාට අනිවාර්යයෙන්ම මෙහෙම ප්‍රශ්න දෙකක් එනවා. ඒ නිසා ඔයා මේ සතියේ පාඩම් පොත හොඳට කියවලා ලියන්න. විරාම ලකුණු කියන්නේ මෙන්න මේවට,"

( . ) තිත - වාක්‍යක අග යොදයි.

උදා: මම කඩයට යමි.

( , ) කොමාව - මද විරාමයක් සඳහා යොදයි.

උදා: අම්මේ, මට හරි කම්මැළියි.

( ! )විස්මයාදී ලකුණ - විස්මයක් දැනවීම සඳහා යොදයි.

උදා: අහෝ, එය පුදුමයකි !

( ?) ප්‍රශ්නාර්ථ ලකුණ - ප්‍රශ්නයක් විමසීම සඳහා යොදයි.

උදා: නුඹ පන්සල් යන්නෙහි ද ?

තිලුනි අක්කා මට විරාම ලකුණු, ඒවා යොදන තැන්, ඒවා යෙදෙන තැන් අනුව වාක්‍ය කියවන විදියත් එක්කම කියලා දුන්නා.

"මගේ දූ ඇයි මේ...? ඔයා අද පාඩම් කරන්නේ නැද්ද. චුටි බූලා කෝ. ඔයා සෙල්ලම් කරන්නේ නැද්ද ? ඇයි මගේ දූ ඔයාට අසනීපයක්වත් ද?" අම්මා මගේ හිස අතගාමින් ඇසුවා.

"අනේ, තිලුනි අක්කා නැතුව හරි පාලුයි අම්මේ"

"ඉතින් දරුවො එයා නිවාඩුවට අත්තම්මා බලන්නනේ ගියේ. ඔයාට පාඩම් වැඩ කියලා දෙන්න කියලා එයා නෑදෑ ගමන් යන්නේ නැතුව ඉන්න ද ?" අපේ අම්මා නෝක්කාඩුවෙන් වගේ එහෙම කීවා.

තිලුනි අක්කා නැති දවස් ටිකේ මට හරි පාළුවක් දැණුනා. ඒත් තිලුනි අක්කා කීව වැඩ හැම එකක්ම මම හරියට ම කළා. පළවෙනි පාඩම් දහය කියවලා එක පාඩමකින් වාක්‍ය දහය බැගින් ලීවා. මට දැන් විරාම ලකුණු හොදට මතකයි. යෙදෙන විදියත් මතකයි. ඒ හැම වෙලාවෙම මට පන්තියේ ගුරුතුමියත් මතක් වුණා. ගුරුතුමිය හැම විටම හරි ලස්සනට වාක්‍ය කියවන හැටි අපට කියලා දෙනවා. කෙටි නැවතුම්, විස්මය දනවන තැන් ... ආදී විවිධ වාක්‍ය රටා ගැන හොදින් කියලා දෙනවා.

තිලුනි අක්කලා කීවට වඩා ඉක්මනින් ගෙදර ආවා. අක්කා ආව ගමන් ම මම එහි යන්න සූදානම් වන විට,

" ඒ දරුවට මහන්සි ඇති, තව ටිකකින් යන්න" ඒ අපේ අම්මාගේ හඩ.

මම අක්කා දුන්නු වැඩ පෙන්නන්න නොඉවසිල්ලෙනුයි හිටියේ. ඔන්න ටික වෙලාවකට පස්සේ මට අක්කලාගේ ගෙදර යන්න අම්මගෙන් අවසර ලැබුණා. මන් කළ වැඩ ඔක්කොම තිලුනි අක්කට පෙන්නුවා.

"ආනේ... නංගියා හොඳට මම කියපු වැඩ ටික කරලා, ඉක්මනටම."

"ඔව් අක්කේ, මම අක්කා කියපු වැඩ ඔක්කොම කළා."

"අක්කා එනකල් මම නොඉවසිල්ලෙන් තමා හිටියේ."

"ඒත් මම හිතුවට වඩා ඉක්මනින් අක්කලා ආවා."

"ඔව් නංගි අපිට කලින් එන්න වුණා.. මේකනෙ, අත්තම්මලා අද දුර ගමනක් දාගෙන තිබිලා. ඉතින් අපි උදේ පාන්දරින්ම එහෙන් පිටත් වුණා."

ටික වේලාවකින් මගේ පාඩම් වැඩ ටික ඔක්කොම තිලුනි අක්කා බැලුවා. ඒ වෙලාවේ ඒ නැන්දා තිලුනි අක්කටයි මටයි රස තේ එකක් ගෙනවිත් දුන්නා. ඒ තේ එකත් එක්ක මට හරි අමුතු කෑමක් දුන්නා. ඒක වොක්ලට් තවරපු උඳු වඩේ එකක්.

පාට පාට මොනවාදෝ කැලි වගයකුත් තිබුණා. ඒකට තිලුනි අක්කනම් කීවේ ඩෝනට් කියලා. මම ඒවා කෑවේ පළමු වතාවටයි. ඒක හරිම රසයි. ඒත් එක්කම තව එකක් අපේ අම්මට දෙන්න කියලා පෙට්ටියක දාල අක්කාගේ අම්මා දුන්නා. මා කළ ගෙදර වැඩ ඔක්කොම හරි. මට හරිම සතුටු සිතුණා.

"අනේ අක්කේ මට සිංහල ප්‍රස්තාව පිරුළු, ඉඟි වැකි, යුගල පද එහෙම හැම වෙලාවෙම වරදිනවා. මට ඒ ටික කියලා දෙනව ද?"

"නංගි මම ඔයාට දෙන්නම් පොතක්.  ඒ පොතෙන් ඔයාට විෂයන් හැම එකක් ගැනම දැනුම ලබා ගන්න පුළුවනි. ඒ පොතේ තියන ටිකයි ඔයාට ගුරුතුමිය කියලා දුන්නු ටිකයි පාඩම් කළොත් හොදටම ඇති. ඊට පස්සේ ඔයාට ඕනම ප්‍රශ්නයකට පිළිතුරු දෙන්න පුළුවන්." තිලුනි අක්කා කීවා. අක්කා දුන්නු ඒ පොත නිසා මට සිංහල, දෙමළ විතරක් නෙවේ ඉංග්‍රීසි භාෂාව, පරිසරය වගේ විභාගය ඉලක්ක කරගත් පාඩම් ගොඩක් ඉගෙන ගන්න පුළුවන්.

"අක්කට ගොඩක් ස්තූතියි. මට මේ උදව් කරනවාට."

"ආ.. ඒක සුළු දෙයක් නංගි. ඒක නෙවෙයි, අපි දැන් දිගටම කළේ සිංහල පාඩම් නේද? හෙට මම අර අරන් දුන්න විභව්‍යතාමාන පොතත් අරගෙනම එන්න. එහෙම වුණොත් ගණිත ගැටලු කිහිපයකුත් කරන්න පුළුවන්නේ."

"හරි අක්කේ මම අරගෙන එන්නම්."

මම අක්කා දුන්නු පොතත් අරන් හවස් වෙලා ගෙදර ගියා. ගෙදර ගිය ගමන්ම අම්මට මම කළ වැඩ පෙන්වන්න අමතක කළේ නැහැ. ආ... අර අමුතු කෑම එක අම්මට දුන්නු වෙලාවේ

"මොනවද පුතේ මේ" අම්මා ඇසුවා.

"අම්මම බලන්නකො?"

"චොක්ලට් තවරපු උඳු වඩයක්. මොනවද මේ උඩින් තවරල තියෙන්නේ" අම්මා මගෙන් ඇසුවා.

"ආ.. ඕවට කියන්නේ ඩෝනට් කියලලු."

"ඈ ! බෝනට්?"

"ඔව් අම්මේ, මමත් කෑවා ඒවා හරිම රසයි. අම්මත් කාලා බලන්නකෝ උඳුවඩේ වගේ නෙවී හරිම රසයි අම්මෙ."

ටික වෙලාවකින් මම විහව්‍යතාමාන පොත අරන් පිටු දෙක තුනක් එක හුස්මට අවසන් කළා. පසුවදා පාසල් ඇරුණු විගසින්ම අක්කලාගේ ගෙදර යන්න හදද්දි ,

"පුතේ, දැන් මහන්සිනේ. තව ටිකකින් යන්නකො, අක්කටත් මහන්සි ඇතිනේ දැනුයි අක්කා ගෙදර ආවේ." තිලුනි අක්කා පාසල් යන්නේ නුවර හොඳ පාසලකට. ඒ ශිෂ්‍යත්වයෙන් පාස් වෙලාලු. තිලුනි අක්කට ශිෂ්‍යත්වයෙන් ලකුණු 191ක් තිබුණලු. ඒ විතරක් නෙවෙයි හැමදාම පන්තියෙ පළමු වෙනියලු. ඔන්න ඉතින් එදානම් මම හවස 4.00 විතර වෙද්දි තමා තිලුනි අක්කලාගේ ගෙදර ගියේ. ඒත් තනිවම නෙවී, විහව්‍යතාමාන පොත් එක්කම. එදා තිලුනි අක්කා මට ගණන් ගොඩක් කියලා දුන්නා. ඒ විතරක් නෙවෙයි. මට හදන්න අමාරුම රටා වර්ග හදන්නත් කියලා දුන්නා. මෙන්න මෙහෙම,

1.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 40 | 3x4 | 12 | 9x3 | 27 | 6x4 | 24 | 6x3 | 18 | 8x4 |

හිස්තැනට සුදුසු ඩොමිනෝපතක් නිර්මාණය කරන හැටි අක්කා කියලා දුන්නා. දෙවන කොටුවේ දැක්වෙන ගණිත කර්මය විසඳීමෙන් එහි පිළිතුර දෙවන ඩොමිනෝපතෙහි ස්ථාන දෙකකින් යුත් සංඛ්‍යාව සමග ගැළපිය යුතුවේ.

2. 100 - △ = ⬡ 48 වේ නම් ⬡ 48 ÷ ⬠ = 6 නම් මෙහි △ සහ ⬠ හි අගය සොයන්න.

"මෙතනදී නංගි 100න් කීයක් ගියාමද 48 වෙන්නෙ කියලා හොයන්න නම් ලෙහෙසියි 100න් 48 අඩු කරන එක. එතකොට පිළිතුර 52යි. 48+52 =100. ඒ කියන්නෙ ත්‍රිකෝණයේ අගය 52යි. අනෙක 48 කීයෙන් බෙදුවම ද පිළිතුර 6 වෙන්නේ අහද්දි අපි 6 ගුණාකාර බලනවා. එහෙම වෙද්දි 6x8 තමා 48 වෙන්නෙ. එහෙනම් ෂඩාස්‍රයේ අගය 8යි."

අක්කා ගණිත ක්‍රම යොදාගෙන විවිධ ගණිත රටා කියලා දුන්නා. පොතක් පිරෙන්න ගණිත වැඩ කළා. මම තවමත් හරි ආදරෙන් ඒ පොත් බලනවා. හැමදාම ඒවා මගේ මතකේ තියේවි.

"අක්කේ, ඔයා දන්නවද අපි ඉස්කෝලේ වාර්ෂික චාරිකාව ළඟදිම යනවා කීවා."

"ආනේ... හරිම හොඳයි. ඔයාල කොහෙද යන්නේ නංගි?"

"මන් හිතන්නේ ගාලු කොටුවට යන්න හදන්නෙ අක්කේ."

"එහෙමද? ඒක හරි වැදගත් චාරිකාවක් වේවි."

"ඇයි අක්කේ, එහෙම කියන්නේ?"

"නංගි, ඔය ගාලු කොටුව කියන්නෙ ඓතිහාසික ස්ථානයක්. ඒ විතරක් නෙවෙයි නංගි ඉස්සර ඕක බලකොටුවක්."

"ආ.. තේරුණා අක්කේ"

"ඔන්න නංගි ශිෂ්‍යත්ව විභාගෙදී දෙවන ප්‍රශ්න පත්‍රයට පරිසර ප්‍රශ්නයක් විදියට ඒක එන්නත් පුළුවන්"

"ඕ.. එහෙනම් ඒක තවත් වැදගත් වේවි නේද අක්කෙ?"

"අක්කලා චාරිකාව යන්නේ නැද්ද?"

"නැහැ නංගි, අපි පළමු වාරයේදීම පාසල් චාරිකාව ගියානෙ."

"ඔයාල කොහෙද අක්ක ගියේ?"

"අපි ගියේ හපුතලේ තේ පැක්ට්‍රිය බලන්න. සුවද දැනෙනවා පුදුම ඇතට. ඒ වගේම මහ විශාල යන්ත්‍ර විවිධ වර්ගයේ ඒවා. ඇත්තටම බලන්න පුදුමයි. හරි ආසයි."

ඔන්න මම පහුවදා උදෙන්ම පාසලට ගියා. පන්තියේ ගුරුතුමියත් දෙන ගෙදර වැඩත් ඔක්කොම කරනවා. ගුරුතුමී සමහර වෙලාවට කියනවා "දැන්නම් දිලුනි හොඳින් වැඩ කරනවා, මට හරි සතුටුයි. හැමෝම ඒ වගේ එදිනෙදා වැඩ ටික හරියටම කළොත් විභාගය කියන්නෙ අමාරු දෙයක් නෙවෙයි... " කියලා.

ඒත් අදනම් මැඩම් දුන්නු අසා ලිවීම වචන දහයෙන් හතරක්ම වැරදුනා. මට හරිම දුකයි."හරියටම පොත කියවලා බලනවනම් එහෙම වෙන් නෑ පුතේ. දුක් වෙන් එපා, ඔයා මං දුන්නු අමතර සටහන් බලන්නකො" මගේ ඇස්වල කඳුළු දුටුව ගුරුතුමී එහෙම කීවා. මන් එදා අක්ක හමුවෙන්න ගියෙත් ඒ දුකින්මයි. මම අක්කට මගේ වචන වැරදීම ගැනත්, මට ගුරුතුමී දුන්නු ඔවදනුත් කීවා. අක්කා මට නැවතත් ඒ අකුරු ගැළපුම කියලා දුන්නා. මට හරි සතුටුයි. දෙවන වතාවටත් කියල දුන්නාම මතකයෙත් රැදෙනවා වැඩියි කියලා අපේ අම්මත් මට නිතරම කියනවා. ඒක ඇත්ත තමයි කියලා මට හිතුණා.

පාසලේ ගුරුතුමිය කියල දෙන පාඩම් වැඩ වගේම අක්කා මට කියල දෙන හැම පාඩම් වැඩක්ම හරි උනන්දුවෙන් ඉගෙනීමට උත්සාහ කළා. ඒ හැම විටම අක්කා මට කීවේ ඔයාට ආයිමත් ගැටලුවක් දැනුනොත් පන්තියේ ගුරුතුමියගෙනුත් අහන්න කියලයි. ගුරුතුමියගෙන් සමහර වෙලාවට අහන්න හිතුනත් මට දුකයි. පන්තියේ ළමයි ගොඩක්, ඒ හැමෝගෙම පොත් මේසය උඩ පිරිලා. ඒ හැම එකක්ම ගුරුතුමිය හරි පරෙස්සමින් කියවල හැම අකුරකම වැරදි හදනවා. මට හිතෙනවා මගේ පන්තියේ ගුරුතුමීත් අපෙ අම්ම කීවා වගේ 'ගුරු දෙවියෙක්' කියලා. ඇත්තටම මේ තරම් ගුරුතුමිය මහන්සි වෙන්නේ අපේ අනාගතය වෙනුවෙන් නේද? කියල හිතුනම මට ගුරුතුමී ගැන ඇතිවෙනනේ ලොකු ආදරයක්. කවදාකවත්ම කිසිම යහළුවෙක්ට ගුරුතුමිය දඬුවම් කළේ නැහැ. ඒ වගේම හැමෝම ගුරුතුමිය කියන පාඩම් වැඩ සියල්ලම උනන්දුවෙන් කළා.

ඉතින්, ඒ අතරතුර තමා අක්කා මට ශිෂ්‍යත්වය ගැනම හිතල මේ අභ්‍යාස වැඩ නිතර නිතර කරවන්නේ. අක්කා දවසක දක්ෂ ගුරුවරියක් වෙයි කියල මට හිතුණා. අක්කා මට අක්ෂර යෙදෙන පාඩම කියල දුන්නෙ මෙන්න මෙහෙම.

"ට" යන්නට හරි "ඩ" යන්නට හරි කලින් "න" යන්න ලියනවනම් අපි ලියන්නෙ මූර්ධජ "ණ" යන්න. මෙන්ම මේ විදියට,

| | |
|---|---|
| භාණ්ඩ | සංස්ථාරය |
| චණ්ඩියා | කාණ්ඩය |
| පණ්ඩිත | කණ්ඨජ |
| දණ්ඩ | අභිකුණ්ඨික |

"ෂ" යන්නට පස්සෙ යෙදෙන "ණ" යන්න

විෂ්ණු හාෂණ රක්ෂණ පාෂාණ දූෂණ

"ශ" යන්නට පස්සෙ යෙදෙන මේ "න" යන්න

ප්‍රශ්න විදර්ශන

දර්ශන ප්‍රකාශන

මෙන්ම මේ වචන බලන්නකො, අපි "ර" යන්නට පස්සෙ මූර්ධජ "ණ" නොලියන වචනත් තියෙනවා. මෙන්ම මේ වගේ.

නාරන් රන්

අබරන් ටකරන්

ඔන්න ඔහොම මූර්ධජ තාලුජ අක්ෂර යෙදෙන විවිධ ආකාර ගැන අක්කා මට කියලා දුන්නා. "ආයිනම් මම අසාලිවීම දහයම ගන්නවා අක්කේ" අක්කා සිනාසිසී මෙහෙම කීවා. "ඔයා මම දුන්නු අමතර ක්‍රියාකාරකම් පොතත් බලන්න. ඔයාගේ පෙළ පොතත් හරියටම කියවන්න. විරාම ලකුණු පාඩම යද්දි ඔයා මේ ගැනත් සිතුවනම් ඔයාට වරදින් නැහැ. කමක් නැහැ කියවන ඕනම දෙයක් අවධානයෙන් කියවන්න. එහෙම වුනොත් අපිට ගොඩක් දේ ඉගෙන ගන්න පුලුවන් නංගි." අක්කා එහෙම කීවා. මන් හිනාවෙලා හිස වනලා අක්කට යන්නම් කියලා ගෙදර ආවා.

ඔන්න අද ඉරිද දවසක්. මම දහම් පාසල් ගිහින් ආවා අක්කා එක්කම. ටික වෙලාවකින් නාල එහෙම ගියා අක්කලගේ ගෙදර. "හැම වෙලේම පාඩම් කරලත් බැහැ පුතේ, සෙල්ලම් කරන්නත් ඕනි ටිකක්." අක්කාගේ අම්මා එහෙම කීවා. මට හරි සතුටුයි. මම අක්කා එක්ක සෙල්ලම් කළා. ටික වෙලාවක් ගියා. මගේ කකුල පැටලිලා වැටුණා.

"ආයි.... අම්මේ.. ඉහි ඉහි මගේ කකුල..."

මගේ ඇඩිල්ල ඇහිලා අම්මත් දුවගෙන ආවා. එයාත් අඩන්න ගත්තා.

නැන්දත් දුවගෙන ආවා. "අනේ, අනේ, සෙල්ලම් කරන්නත් ඕනි. වැටෙන්නත් ඕනි.

ළමයි හැමදාම මල් වගේ ඉදලා බැහැ. හැමදේමටම හුරු වෙන්න ඕනි" අක්කගේ අම්මා කියාගෙන ගියා. මගේ වේදනාවත් නැවතුණා. අපේ අම්මගේ ඇඩිල්ලත් නතර වුණා.

අක්කා ඉක්මනට ගිහින් අමුතු ඉංග්‍රිසි නමක් ගහපු පෙට්ටියක් අරන් ඇවිත් මගේ තුවාලයට බෙහෙත් දැම්මා. මට පුදුමයි. ටිකක්වත් රිදුනේ නැහැ.

"අක්කේ, ඔයා කොහොමද ඔය තරම් හොඳට ඔය වැඩ ඉගෙන ගත්තේ?"

"ලොකු අත්තගෙන් නංගි"

"ඇ..! "

"ඔව් නංගි, මගේ ලොකු අත්තා ආයුර්වේද වෛද්‍යවරයෙක්."

"නංගි දන්නවද? කුරුම්බැට්ටියේ උඩ පොත්ත ගලවලා ගලක ගානවා. එතකොට හැදෙනවා දුඹුරු පාට පේස්ට් එකක්. ඒක ගෑවම තුවාල හොඳවෙනවා කියලා අපේ ලොකු අත්තා ඉස්සර කියලා තියනවා. ඒ විතරක් නෙවෙයි, අගුණ කොළ හෙම්බිරිස්සාවට ගොඩක් හොඳයිලු. තෙඹු කොළ සම්බලය සීනි ලෙඩ්ඩුන්ට හොඳයිලු. ඉස්සර ඉරමුසු, සස්සද මුල්, ගොටුකොළ මුල් ඒවා තම්බලා බොනවලු. නිදිකුම්බා තම්බලා කුෂ්ට හැදෙන අයගේ ඇඟ සෝදනවලු. එහෙම කළාම ලෙඩ හොඳවෙනවලු. ඉස්සර ගත්ත හැමදේම ඖෂධයක්මලු. ලොකු අත්තා කියන්නෙ දැන් මිනිස්සු ගන්න හැමදේම වස තමා කියලා...." ඔන්න ඔහොම අක්කා එයාගේ ලොකු අත්තා වෙදෙක් බවත්, එයාගෙන් ඒ වැඩ ඉගෙන ගත්තා කියලත් ලොකු විස්තරයක් කීවා. මට හරි සතුටක් දැනුණා. අක්කගෙන් බෙහෙත් වර්ග ගැන ආයි දවසක අහගන්න පොරොන්දුවත් එක්ක නැන්ද දුන්නු තේ එක බීලා මමත් අම්මත් ගෙදර ආවා.

තුවාලය වේලෙන්න දවස් දෙක තුනක් ගියා. ඒත් බෙහෙත් දැම්මේ අක්කා තමයි. ඒ වුණාට අම්මා කියන්නෙ ඒ අක්කගේ අත් ගුණේ හොඳයිලු. ඒ නිසාමලු මෙහෙම ඉක්මනට හොඳ වුණේ. මේ දවස් දෙක තුනම මම විවේකෙන් හිටියා. මොකද අඩිය තියද්දිම තුවාලය වේලෙන නිසා රිදෙන්න ගන්නවා. බයටම ගෙදරට වෙලාම හිටියා. අක්කලාගෙ ගෙදරටවත් ගියේ නැහැ. අක්කා ඇවිත් තුවාලෙට බෙහෙත් දාලා යනවා.

දැන් පාසල් නිවාඩුව. ගෙදරටම වෙලා ඉන්න හරි කම්මැලියි. පාසලේ ගුරුතුමිය දෙමාපිය කැමැත්ත අරගෙන අතිරේක පාඩම් වැඩ කරන්න සතියට දින දෙකක් වෙන් කළා. මමත් හරි ආසා වුණා. ඒත් පළමුවෙනි සතිය අපිට නෑදෑ ගමන් යන්න, විනෝද චාරිකා යන්න වෙන් කරගන්න කියලා ගුරුතුමිය කීවා.

"ට්‍රීං.... ට්‍රීං.......... ට්‍රීං....."

"පුතේ බලන්න පියුම් මාමා ඇවිත්, අම්මා කීවා."

මම දුවගෙන ගිහින් බැලුවා. ලියුමක් ඇවිත්.

"අම්මේ, ලියුමක්"

"කෝ බලන්න"

"පුංචි අම්මාගෙන් ලිපියක්" ලිපිය බැලුව අම්මා කීවා.

අම්මා පුංචි අම්මගේ අකුරු හොඳට අඳුනනවා. ඒ නිසා දුටුව ගමන් කීවා පුංචි අම්මා එවලා තියෙන්නෙ කියලා. නිවාඩුව නිසා පුංචි අම්මලා එනවද දන්නේ නැහැ. මම තනිවම සිනාසුණා. මොකද නංගිල දෙන්නා ආවොත් ටිකක් සෙල්ලම් කරන්න හැකි වේවි කියලා හිතුන නිසා. ඉතින් මම අම්මා ලිපිය කියවල මොනාද කියල තියෙන්නෙ කියනකම්ම උන්නෙ හරි හදිස්සියෙන් තමයි.

අංක 102,

පදියතලාව,

2024 නොවැම්බර් 22,

නිවසේ දී,

තුණුරුවන් සරණයි!

ආදරණීය අක්කේ,

අක්කාට කොහොම ද? හැමෝම හොඳින් ඇතිය කියලා හිතනවා. අපිත් හැමෝම හොඳින් ඉන්නවා.

ගොඩ දවසකින් ලියමනක් ලියන්න බැරි වුණා. එන්න කියලා හිතුවත් වෙලාවක් තිබුණේම නැහැ. අපේ කුඹුරේ යල කණ්නයේ වැඩ පටන් ගත්තා. වතුරනම් අඩුවක් නැහැ. මේ වතාවේ කුඹුරුවලට හරි හොඳයි.

ඒක නෙවේ, චූටි දූ මේ වතාවේ විභාගෙ ලියනවනේ නේද? කොහොම ද, පාඩම් වැඩ හොදට කරනවද? මහන්සිවෙලා පාඩම් වැඩ කරන්න කියන්න. තෙරුවන් සරණින් අපේ දරුවා පාස් වේවි. මම චූටි මැණිකට ආශිර්වාද කළා කියන්න විභාගේ ඉහළින්ම පාස් වෙන්න කියලා. එයාට නුවර ටවුමේ ඉස්කෝලෙකට යන්න පුළුවන් එතකොට.

අයියවත් මතක් කළා කියන්න. ඔයාලට තෙරුවන් සරණයි.

මෙයට,

ආදරණීය,

රමායා නංගී.

මට ඒ වෙලාවෙ තමයි මතක් වුණේ. නිවාඩු කාලේ ගෙදර වැඩ වලට ලිපියක් ලියන්න තියෙනවා නේද කියලා. පන්තියේ ගුරුතුමී කියලා දුන්න කරුණුත් මතක තියාගෙන මම ලිපිය ලියන්න ගත්තා. ඒ වෙලාවේ අක්කා ආවා අපේ ගෙදර ඇවිත් යන්න. මට හරි සතුටුයි. මම අක්කට ලිපිය ලිවීම ගැන කීවා. අක්කා මට ලිපියෙ ආකෘතිය ආයිමත් කියලා දුන්නා.

ලිපිනය

දිනය

ලිපිය ලියන ස්ථානය

ආශිර්වාදය

ආමන්ත්‍රණය

අන්තර්ගතය

අවසානය

"අපේ පුංචි අම්මා හරියටම ලියුම ලියලා..." මම හයියෙන් කෑ ගැහුවා.

"අනේ, අනේ, ගැහැණු ළමයි හැදෙන විදිය" අම්මා එකපාරටම කීවා.

අක්කටත් හිනා.

"අම්මේ, අපේ පුංචි අම්මත් ශිෂ්‍යත්ව විභාගේ පාස් කළාද?"

"මොනවද දරුවො මේ අහන්නෙ?"

"නෑ නෑ පුංචි අම්මා හරියටම ලියුමක් ලියන විදිය දන්නෙ කොහොමද නැත්නම්?" අම්මයි අක්කයි දෙන්නම හිනා වුණා. එහෙම තමයි නංගි ඉස්සර කාලේ ශිෂ්‍යත්ව විභාගයක් තිබුණෙ නැහැ. ඒත් එයාල හොඳට ඉගෙනගෙන තියෙනවා. මට ඇහිලා තියනවා අපේ ලොකු අත්තා කියනවා එයාගේ අප්පච්චි ගියේ පහේ කැලෑසියට කියලා.

"හික්...හික්...හික්..." මම ආයිමත් හිනා වුණා.

"කැලෑසිය, ඒ මොකක්ද අක්කෙ ඒ."

"පහේ පන්තියට ගියා කියන එකනේ නංගි. ඒ කාලේ එහෙම තමා ඉතින් කියලා තියෙන්නෙ."

"අක්කනම් ගොඩක් දේවල් ලොකු අත්තලා එක්ක ඉඳලම ඉගෙන ගෙන. මටත් ආසයි ඒවා දැනගන්න. මම විභාගේ අවසන් වුණාම ටික දවසක් අත්තම්මලගේ ගෙදර ගිහින් ඉන්න අම්මා කැමති කරව ගත්තා. ඒ මටත් එයාල කියන අමුතු වචන අහගන්න තිබුණ ආසාවට. "

"අපි හෙට ගමේ ගිහින් එමු?" අම්මා එකපාරටම කීවා.

"අනේ අම්මෙ, මට පාඩම් වැඩ ගොඩක් තියනවනේ."

"කමක් නෑ පුතේ, අපි ගිහින් එමු" අප්පච්චි කීවා.

"පාඩම් වැඩ කරන්න ඕනි. ඒත් නිවාඩු කාලේ කොහෙහරි ගියාම ඔයාටත් හොඳයි"

ලොකු අම්මලාගේ ගෙදරත් අත්තම්මලාගේ ගෙදරත් තියෙන්නෙ එක ළඟ නිසා මටත් හිතුණා අයියලා අක්කලා එක්ක ටිකක් සෙල්ලම් කරලා විනෝද වුණොත් හොඳයි කියලා. මමත් ගමනට කැමති වුණා. අක්කටත් කියලා මමත් ගමන පිටත් වුණා. අපි ගොඩ කාලෙකින් තමා එහේ යන්නෙ. අම්මා කියන්නෙ එහෙ ඉඩම් අරන් පස්සෙ කාලෙක අත්තම්මලා ලොකු අම්මලා ගියාලු ලොකු අම්මා බැඳලා ඉන්න ලොකු අප්පච්චි ඉන්න දිහාවට. මොකද එයාට යායට කුඹුරු තියනවලු. ඒවගේ වැඩට එන අයට කෑම බීම හැදීම තනිවම ලොකු අම්මට කරන්නත් බැහැලු. ඒ නිසා උදව්වට ගිහින් එහෙ ඉඩකඩම් අරන් අත්තම්මලත් පදිංචි වුණා කියලා අපේ අම්මා කියනවා.

ඒත් ඔය තරම් අව් රස්නිය තියන පැත්තකට මොකට ගියාද කියලත් මටනම් හිතෙනවා.

දින දෙකක් ගෙවිලා ගියා. ඇතිවෙන්නම වෙල් ලියදි පුරා දිවුවා. දියේ ගිලිලා නෑවා. මට හරි සතුටුයි. මොකද ගෙදර හිටියත් අම්මා කවදාවත් ඇල්ලන ඔයට ගියේ නැහැ නාන්න. ආස හිතුනම බලලා එන්න යනවා මිසක් ඔයට බහින්න දෙන් නැහැ මට. ඔයේ ගැඹුරු බිලිගන්න තැන් තියනවා කියලා අම්මා කියලා තියනවා. අපේ අම්මා කියන්නෙ වසරකට දෙකකට වරක් විතර කොහේ හරි බිල්ලක් යනවා කියලා. එයා එක අයියා කෙනෙක් බිලි අරන් මරණෙ බලන්න ගිහින්. ඊට ඉස්සරනම් අම්මලා ඔයේ දිය බුං ගහලා නානවලු. වැස්ස කාලෙට හරියට වතුර දෙගොඩ තලා යනවා කියලයි කියන්නෙ. ඒ වතුරෙත් පිහිනනවලු. මටත් ආසයි එහෙම පිහිනන්න. ඒත් අර බිලිගත්ත අයියා බැලුවට පස්සෙ කවදාවත්ම අම්මා දියේ ගිලිලා නෑවේ නැහැයිලු. පස්සේ ඔයට යන්න අත්තම්මලා ඉඩ දුන්නෙ නැහැ කියලා තමා කීවේ.

දින දෙකකට පස්සේ අපි ආයෙමත් ගෙදර එන්න පිටත් වුණා. ගෙදර එද්දිනම් ගොඩක් වෙලා ගියා. ගමනට ආස වුණාට දුර ගමනක් නිසා හරි වෙහෙසයි. වෙනසකට වගේම අයියලා අක්කලා එක්ක විනෝදයෙන් ඉන්න පුළුවන් නිසා හොඳයි තමා. අපිට ඒ පරිසරය, දේශගුණය ටිකක් දරන්න අමාරුයි කියලා අපේ අම්මත් නිතරම වගේ කියනවා. අත්තම්මා වයසයිනේ කියලා මෙහෙ එමුයි කීවට දැන් එයාලත් ඒ පරිසරයට හුරු වෙලා නිසා එන්න වැඩි උනන්දුවක් නැහැ.

අපි එද්දි අළුත් සහල්, අරන් ආවා. අම්මා අළුත් හාලේ කිරිබත් කන්න කියලා තිලුනි අක්කලගේ අම්මටත් ටිකක් ගිහින් දුන්නා. හරි ලස්සනට හිනාවෙලා ඒ නැන්දා

"ස්තූතියි, ඔයාල දුර ගිහින් ගෙනාවේ. මම ගන්න එක හරිද මන්ද?" කීවා.

අපේ අම්ම හිනා වෙලා "ඕක උස්සන් ආවේ නැහැ අක්කේ, බස් එකේ ගෙනාව එක මහ බරක්යැ" යි පිළිතුරු දුන්න. කෙසෙලේ ගෙඩි වගයක්, අත්තම්මා හදලා දුන්නු අලුවා වලින් පාර්සලයක් එහෙම අම්මා අරගෙනයි අක්කලාගෙ ගෙදරට ගොඩ වුණේ. ඉතින් ගමන ගැන අත්තම්මලාගේ විස්තර ඔක්කොම කතා කරල අපි ගෙදර ආවා.

අනේ හරි නිරහංකාර මිනිස්සු. කිසි මදි පුංචිකමක් නැතුව සතුටින් භාර ගත්තා. අම්මා එහෙම කීවේ එයාල අපේ ගමට පිටින් ආව අය නිසා.ගොඩක් අය එහෙම ආවම කතා බහ නොකර ඉන්නවනෙ සමහර වෙලාවට. අනෙක එයාල වැඩට යනවා, අක්කා උදෙන්ම පාසල් යනවා, ආයි හවස තමා ගෙදර එන්නෙ. ගමේ අයත් එක්ක ගැටෙන්න එයාලට වෙලාව නැහැ.

ඔන්න මම ආයිමත් පුරුදු විදියට වැඩ පටන් ගත්තා.

"විනෝද වෙලා ආව නිසා හැමදේම අමතක හෙම වුණේ නැහැ නේද?" තිලුනි අක්කා හිනාවෙලා ඇහුවා.

"අනේ නැහැ අක්කේ, මට හැමදේම මතකයි. අපේ ලොකු අම්මලාගේ අයියත් මට ටිකක් පාඩම් වැඩ කියලා දුන්නා." මම ඒ ගැන තිලුනි අක්කාට විස්තර කළා.

"හරි එහෙනම් අද මම නංගිට කියලා දෙන්නම් ප්‍රස්තාව පිරුළු, ඉඟි වැකි සහ යුගල පද කියන්නෙ මොනාද කියල?"

"ආ.. ඒක හොදයි."

"අපි ඉස්සර වෙලාම යුගල පද ගැන බලමු."

"යුගල පද හැදිල තියෙන්නෙ වචන දෙකකින්. ඒ වචන දෙක සමාන, විරුද්ධ පද සමහරවිට කිසිම තේරුමක් නැති වචන වෙන්නත් පුළුවන්"

හරකා බාන

ගෙවල් දොරවල්

වතු පිටි

අහල පහල

කෙලි සෙල්ලම... වගේ.

"මේ තියෙන්නෙ ප්‍රස්තාව පිරුළු. මේ බලන්න මේ හැම ප්‍රස්තාව පිරුළකම සැඟවුණු අර්ථයක් තියනවා.

කළුවා මාරපන ගියා වගේ - විමසීමකින් තොරව යමක් කිරීම

ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ -අනුන් රවටන්න ගොස් තමන්ම රැවටීම

යුගල පද, ප්‍රස්තාව පිරුළු වගේම තවත් විභාගයට එන වැදගත් පාඩම් කොටසක් තමා ඉඟි වැකි. දැන් ඒ ගැන බලමු. ඉඟි වැකිවලට රූඩි කියලත් කියනවා. හැම ඉඟි වැකියකටම සැගවුණු අර්ථයක් තියනවා. හරියට ප්‍රස්තාව පිරුළු වගේමයි. ඒක පටලවගන්න හොඳ නැහැ.

ඉහේ මලක් පිපුණා වගේ

ආරේ ගුණ නැරේ

කිඹුල් කඳුළු හෙලනවා"

"හරි හරි මට හොඳට තේරුණා. අක්කේ මේවා අපේ ගුරුතුමිය දුන්නු ප්‍රශ්න පත්‍රයක තිබුණා. මට දැන් පුළුවන් ඉඟි වැකි යි ප්‍රස්තාව පිරුළුයි වෙන් කරලා හඳුනගන්න. ස්තූතියි ඔයාට."

"හරි හරි මට ස්තූතියි නොකීවට කමක් නැහැ. ඔයා විභාගේ පාස් වෙනවා කියන එක තමා මට කරන ස්තූතිය." අක්කා එහෙම කියද්දි මට සිහින් සතුටක් දැණුනා.

පාසලේ නිවාඩු කාලයේ අමතර පන්ති දවස. මම පන්තියට සහභාගී වුණා. ගුරුතුමිය අද දුන්නෙ සිංහල ප්‍රශ්න පත්‍රයක්. මම රූඩි, ඉඟි වැකි, ප්‍රස්තාව පිරුළු හරියටම කළා. ගුරුතුමීටත් සතුටුයි. "දිලුනි දැන් හරි දක්ෂයි. අමතර පොත් කියවනවද? "

මම ගුරුතුමියට තිලුනි අක්ක ගැන කීවා. "හරි හොඳ දරුවෙක්. එහෙම තමා ඉගෙන ගන්න ගමන් අනෙක් අයටත් කියලා දුන්නම මතකේ ගොඩක් වැඩි වෙනවා. ඒක ඒ දරුවටත් හොඳයි. එයා හරි දක්ෂ දරුවෙක් වෙන්න ඕනි. මමත් තිලුනි දුව මතක් කළා කියන්න. ඔයා ගෙදර දෙන වැඩ එයා එක්ක හරියටම කරනවා කියලා මට හිතෙනවා. මොකද මේ ළඟකදි ඉඳළ මට තේරෙණව දිලුනි ආසාවෙන් උනන්දුවෙන් වැඩ කරනවා කියලා. " ගුරුතුමිය සතුටු වුණා. අපේ අම්මා මාව එක්ක එන්න පාසලට ආවම ගුරුත්මිය ගොඩක් වෙලා කතා කළා. මං යහළුවන් එක්ක ටිකක් සෙල්ලම් කළා අනෙක් අම්මලා එනතුරු. ඒ අතරෙ මම අපේ අම්මා දිහා ටිකක් විපරමින් බැලුවා. අම්මා ඇස් දෙකේ කඳුළු පිසදමනවා ඉඳ හිට මම දැක්කා.

විභාගය කෙමෙන් කෙමෙන් ළං වෙනවා. තිලුනි අක්කා මට කීවේ සිංහල වගේම සාමාන්‍යයෙන් අපි භාවිතා කරන ඉංග්‍රීසි වචන දැනගන්නත් ඕනි කියලා. තිලුනි අක්කා ඉංග්‍රීසි කතා කරනවා අහන් ඉන්න ආසයි. එයා හරියට කතා කරද්දි ගඟක් ගලනවා වගේ. චතුර විදියට කතා කරනවා. එයාගේ පුංචි අම්මාගේ පුතා ඉන්නේ එංගලන්තයේලු. එහෙ ඉගෙන ගන්න ගිහින්, විශ්ව විද්‍යාලයකට. මං එහෙ පාඩම් වැඩ කරද්දි අක්කාට කතා කළා. හරි හරියට වැස්සක් වහිනව වගේ කතා කළේ. ඉතින් අක්කා මට එයාගේ අයියා ගැනත් ඉඳ හිට කියනවා.

| | | | |
|---|---|---|---|
| පනාව | - Comb | අලියා | -Elephant |
| කෝප්පය | - Cup | මදුරුවා | -Mosquito |
| ඉඳිකටුව | - Needle | මකුළුවා | -Spider |
| හැන්ද | -Spoon | මාළුවා | -Fish |
| පිහිය | - Knife | පන්සල | -Temple |
| ඉදල | -Ekel broom | පල්ලිය | -Mosque |
| පුටුව | -Chair | කෝවිල | -Church |

ඔය ආදී විදියට ඉංග්‍රීසි වචන වගේම

මෙහෙට එන්න - ඉංගේ වාරුංගළ්

කොහෙද යන්නේ? - එංගේ පෝරුංගළ්?

එළියට යන්න - වෙළියේ පෝහළාමා

ඔයාගේ ගම කොහේද? - උංගළ් ඌර් එදු?

ඔයාගේ නම මොකක්ද?- උංගළ් පෙයර් එන්න?

වගේ දෙමළ වචනවලට සිංහල අර්ථ, සිංහල වචන දෙමළෙන් ලිවීම ගැනත් ගොඩක් කරුණු කියලා දුන්නා.

"නංගි දන්නවද, තේරවිලි වර්ගත් ගොඩක් තියනවා. සරල තේරවිලි, තුන්තේරවිලි, පද තේරවිලි, තේරවිලි කවි වගේ. මෙන්න මේක අහල තියනවද?" අක්කා ඇහුවා.

"නූල් බැඳි අහස් යානාව"

"ආ.. ප්ලෙන් එක නේ අක්කෙ?" මම කීවා.

"නැහැ නැහැ ඒ සරුංගලය" අක්කා කීවා.

"ගොහොරු වේල්ල" ගොහොරුනම් මඩ
වේල්ලනම් කණ්ඩිය
මඩ කණ්ඩිය - කඩ මණ්ඩිය

ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මලවැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

ටිං ටිං ගාන්නා ලේනා නොවේදෝ
ටං ටං ගාන්නා ගෝණා නොවේදෝ
මගවැලි පිසින්නා කුකුළා නොවේදෝ
දෙගම්බඩ රජා කිඹුලා නොවේදෝ

ඉතින් තිලුනි අක්කා මට කියලා දුන්න පාඩම් අපමණයි. ශිෂ්‍යත්වයට ඒවි කියලා හිතන වචන ලැයිස්තුවක් අක්කා මට දුන්නා. මම ඉදහිට ඒවත් බැලුවා. තිලුනි අක්කා කියන්නෙ මගේ පාඩම් වැඩ වලට ගොඩක් උදවු කරපු කෙනෙක්. මගේ විභාග දිනය ළං වෙද්දි අක්කා මට පාඩම් කියලා දුන්නත් කවදාකවත්ම සැරෙන් එක වචනයක් කතා කළේ නැහැ. වැරදුනත් ආදරෙන් කියලා දුන්නා. කවදාකවත්ම කිසිම දෙයක් මගෙන්වත් මගේ අම්මා අප්පච්චිලගෙන්වත් අක්කලා බලාපොරොත්තු වුණේ නැහැ.

විභාග දිනය හෙට කියලා තිලුනි අක්කයි එයාගේ අම්මයි අපේ ගෙදර ආවා. එයාගේ අප්පච්චි වැඩට ගිහින්. ඒ නිසා මේ දෙන්න විතරයි ආවේ. ඇවිත් මට පහුවෙනිදට අරන් යන්න ඕනි හැම දේම කියලා දුන්නා.

අඩිරූලක්, පැන්සලක්, මකන කැල්ලක්, නිල් පාට පෑන් දෙකක් සහිත විනිවිද පෙනෙන පෙන්සිල් කේස් එකකුත් අරන් ම අක්කා එහෙම අපේ ගෙදර ආවේ. පහුවෙනිදට පොඩි කෙටි කෑමක් සහ වතුර බෝතලයක් වගේ අවශ්‍ය නම් ලේන්සුවක් හැර වෙන මුකුත් අරන් යන්න එපා කියලයි අක්කා මට කීවේ. පාසලේ ගුරුතුමිය අවශ්‍ය දේ ලැයිස්තුවක් ලබා දුන් බව මම අක්කාට කීවා.

පහුවදා මම පුරුදු විදියට උදෙන්ම අවදි වෙලා මුහුණ සෝදා පිරිසිදු වී සුපුරුදු සුදු ඇඳුමින් සැරසුණා. සුපුරුදු විදියටම උදේ ආහාරය මද පමණක් ගෙන බුදුන් සහ ගණ දෙවියන් වැන්දා. අම්මාට දණ නමා වදින විට සුපුරුදු විදියට ලස්සනට පින් දුන්නා. අප්පච්චිට වැන්දම මුහුණ සිප තෙරුවන් සරණයි පුතේ. සැහැල්ලුවෙන් හොඳින් ප්‍රශ්න කියවලා කලබල නොවී ලියන්න කියලත් කීවා.

"පුතේ පරක්කු නොවී පිටත් වෙමු. වාහන තදබදය ආවොත් පරක්කු වෙන්න ඉඩ තියනවා" කවදාවත් කොපමණ හදිසි වුණත් කඩිමුඩියක් නොමැති අප්පච්චි අද එහෙම කීවා. අම්මා පිරුණ වතුර වීදුරුවක් ගෙන මා ඉදිරියෙන් පැමිණ මට වතුර උගුරක් පෙව්වා. හැමදාම වගේ මගේ නිවස ඉදිරිපිට පිච්ච මල් පිරුණු වතුර බඳුන ලස්සනට තිබුණා. මම අම්මාත් අප්පච්චිත් සමග විභාගය සඳහා පිටත් වුණා. ඒත් එක්කම තිලුනි අක්කයි, එයාගේ අම්මයි අප්පච්චියි හැමෝම පාරට ඇවිත් හිස අතගාලා "ජය වේවා" පුතේ කීවම "GOOD LUCK " නංගා කියලා අක්කා THUMB UP එකක් දැම්මා. මං හිනාවෙලා හැමෝටම ආචාර කර විභාගයට පිටත් වුණා. ඔන්න ඔහොමයි මම එදා ශිෂ්‍යත්ව විභාගයට පිටත් වුණේ.

අද මම ඇවිත් ප්‍රතිඵල කීවම ඒක අහපු අක්කා කීවේ කොපමණ අභියෝග, දුෂ්කරතා, බාධක තිබුණත් පළමු කඩයිම ජය ගත්තා වගේම ඉදිරියේ එන හැම දේම අභියෝගයක් ලෙස අරන් වැඩ කරන්න කියලා. එයාල හැමෝම මට සුබ පැතුවා. දැන් ඉතින් මටත් තිලුනි අක්කට වගේම නුවර පාසලකට යන්න හැකිවේයැයි සිහින දකිමින් ඇඟිලි ගනිමින් ඉන්නවා.

තිලුනි අක්කගේ බලාපොරොත්තුව වෛද්‍ය අංශයෙන් කථිකාචාර්යවරියක් වීමලු. එයා ගොඩක් රිසර්ච් කරනවා. පොත් ලියනවා. බාහිර වැඩ ගොඩකුත් එක්ක පාඩම් වැඩත් අතපසු නොකර කරනවා. අක්කා මට කියන්නෙ හැමදේම ඉගෙන ගන්න ඕනි. පාඩම්ම විතරක් කරල බැහැ කියලා. මම තිලුණි අක්කගේ බලාපොරොත්තුව ඒ අයුරින්ම ඉටු වෙන්න කියලා හදවතින්ම ප්‍රාර්ථනා කරනවා.

මගේ බලාපොරොත්තු, සිහින ඉටුකර ගැනීමට පාසලෙන් ලැබුණු අධ්‍යාපනයට අමතරව පොත්පත් කියවීම, දැනුම තිබෙන වැඩිහිටියන්ගේ උදව් උපකාර ලබා ගැනීම, උත්සාහයෙන් වැඩ කිරීම වගේම නිරන්තර අභ්‍යාසවල යෙදීම මහත් පිටිවහලක් වූ බව නැවත කිව යුතු නැත. එලෙස මාගේ පළමු කඩඉම ජයග්‍රහණය කළ සේම, ආයිමත් මේ වගේම කඩඉමක් පසු කර මගේ කතාව දවසක ඔයාලට කියන්නම්.

-නිමි-

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්